# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

**<u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>**

**<u>දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සිසුන් (පිරිමි) සඳහා නේවාසික පහසුකම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලියට/බද්දට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (පිරිමි) සිසුන් සඳහා නේවාසික පහසුකම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් වසරක කාලයක් සඳහා කුලියට/බද්දට ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. (ආයතනයේ අවශ්‍යතාවය පරිදි බදු කාලය දීර්ඝ කරනු ඇත.)

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය රාජගිරියේ පිහිටා ඇති බැවින් එම පරිශ්‍රයට ආසන්නව පිහිටි සුදුසු ගොඩනැගිලි සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. අවම වශයෙන් සිසුන් 40 කට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුයි.

ගොඩනැගිල්ලේ තිබිය යුතු මූලික පහසුකම් සහ කොන්දේසි

| | | | |
|---|---|---|---|
| 01. | නිරවුල් අයිතිය | 05. | භූමිය වටා මනාව ඉදිකළ තාප්පය හෝ ආරක්ෂිත වැටක් |
| 02. | ජලය හා විදුලිය | 06. | උප ශාලාධිපති /විනයාරක්ෂක නේවාසික පහසුකම් |
| 03. | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට පහසුවෙන් ලඟා වීමේ හැකියාව | 07. | විධිමත් ප්‍රවේශ මාර්ගයක් |
| 04. | ප්‍රමාණවත් වැසිකිළි හා නාන කාමර පහසුකම් | | |

මේ සඳහා උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමියන් හට අදාල ලංසු පත්‍රිකා ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකි අතර ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු 2000.00ක් මුදලක් මහජන බැංකුව බොරැල්ල යන ශාඛාවේ අංක **078100192268358** යන ගිණුමට බැරකර එහි කුවිතාන්සිය ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අදාළ ලංසු පත්‍රිකාව ලබා ගත හැක.

අයදුම්පත් නිකුත් කරන කාලසීමාව වනුයේ 2020.10.02 සිට 2020.10.23 දින දක්වා සතියේ දිනයන්හිදී ලබාගත හැක.